# වගාවේ ක්ෂේත්‍ර ගැටළු අවම කිරීමට දැනුවත් වෙමු

බෝග වගාවන්ගේ ක්ෂේත්‍රයේදී ඇති වන්නා වූ ගැටළු විවිධ කාරක හා හේතු සාධක නිසා හටගන්නා බව ක්ෂේත්‍ර ගැටළු අධ්‍යයනයේදී පැහැදිලිව පෙනී යන කරුණකි. වරෙක එය බැක්ටීරියා, දිලීර වෛරස හෝ වටපනු වැනි රෝග කාරකයක් නිසාවෙන් ඇති වූවකි. තවත් විටෙක එය විවිධාකාර වූ කෘමි හා කෘමි නොවන පළිබෝධක සතුන් නිසාවෙනි. තවත් වරෙක එය වල් පැළෑටි නිසාවෙන් ඇති වූ තත්ත්වයකි. එසේම අහිතකර වායව හා පාංශු පරිසර තත්ත්වයන් හා කායික හේතු නිසාවෙන් ද ගැටළු ඇතිවන අවස්ථා දැකිය හැකිය. මේ කවර තත්ත්වයක් නිසාවෙන් වුවද වගාවට හා අස්වැන්නට ප්‍රමාණාත්මක හා ගුණාත්මක හානියක් වන බව නම් අප කවුරුත් හොඳින්ම දන්නා කරුණකි.

වගාව ආරම්භයේදීම ඇති වන්නා වූ මෙම ගැටළු නිසි ශාස්ත්‍රීය විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය තුළින් අවම කරවා ගැනීමට කටයුතු කළයුතු වන අතරම වගාව අතරතුරදී ඇතිවන ගැටළු නිරාකරණයට, අවශ්‍ය නිසි වැඩපිළිවෙල ගොවි මහතුන් දත යුතු වේ. එමගින් අවම පිරිවැයක් යොදවා සාර්ථකව, හා ඉක්මණින් ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කර ගත හැකි වේ. අදළ ක්ෂේත්‍ර ගැටළු නිසි පරිදි පාලනයට අවශ්‍ය ප්‍රවේශයන් ලබාදීම මෙම ලිපියේ අරමුණයි.

වගාව ආරම්භයේම පෙර සිටම හා වගාව තුළදීත් අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු පිළිවෙත් හා කාර්යයන් කිහිපයක් ප්‍රථමයෙන් සඳහන් කරමු.

1. කිසියම් වගාවක් ආරම්භයට පෙර හා වගාව තුළදීත් අදළ භෝගයට අදල වන්නා වූ වගා තාක්ෂණික කරුණු පිළිබඳව දැනුවත්වීම අත්‍යාවශ්‍යය.

2. තවද අදළ භෝගය අදළ ප්‍රදේශයේ වගාවට යෙ-ාමු වීමට පෙර අදළ කලාපයේ එම වගාවට අදළ විභවය හා ඇතිවන සාමාන්‍ය ගැටළු පිළිබඳව දැනුවත්වීම අවශ්‍යය. මේ පිළිබඳව අදළ භෝග යන්ගේ ක්ෂේත්‍ර ආදර්ශන නිරීක්ෂණය තුළින් හා කුඩා පරිමාණයේ වගාවන් තමන් විසින් අරඹා අත්දැකීම් ලබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

3. අදළ එක්රැස් කරගත් හා ලබන තොරතුරු ලිඛිත පත්‍රිකා ආදිය නැවත නැවත පරිශීලනය කරගත හැකි පරිදි ගොනුකර තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

4. නිරන්තර වගාව සම්බන්ධව වාර්තා තබා ගැනීම සිදුවිය යුතු අතර වගාවේ ක්ෂේත්‍ර ගැටළුවල අත්දැකීන තත්ත්වයන් ක්ෂේත්‍ර ඡායාරූප සාම්පල එක්රැස් කර තබා ගැනීම ආදිය වැදගත් වේ.

5. නිරන්තරව අළුත්වන තොරතුරු එක්රැස් කරගත හැකි ස්ථාන සහ පුද්ගලයන් හා පිළිබඳව දැනුවත්වීම, යොමුවීම හා ක්ෂේත්‍ර දින, භෝග සායන ආදියට සහභාගිවීම ප්‍රයෝජනවත් වේ.

---

**අයි.කේ. අහපත්තු**
පර්යේෂණ නිලධාරී, ප්‍රාදේශිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල.

---

නිරන්තර තම වගාවන් පරීක්ෂා කිරීමේ පුරුද්ද හා යාබද ගොවි මහතුන් හා සහයෝගයෙන් කටයුතු කිරීම ද කළ යුතුය. මෙලෙස වගාව ගැන දැනුවත් ඔබ, නිරන්තර ක්ෂේත්‍ර පරීක්ෂාවේ යෙදෙන බව ක්ෂේත්‍ර ගැටළුව හේතු සාධකයක් නිසා ඇති වූවක් ද යන්න සොයා බැලීමට ඔබ විමසිලිමත් විය යුතුය. එනම් පළමු කොටම ඔබ විසින් මෑතකදී කරනු ලැබූ ක්ෂේත්‍රයේ කටයුතු මෙන්ම කාලගුණ තත්ත්වයන් ගැන ද සලකා බැලිය හැක. එනම් ජල පාලනයේදී, පොහොර යෙදීමේදී, අතුරුයත් යාමේ උපකරණ භාවිතයේදී බෝගයන්ට යම් යම් හානි සිදු වූයේද යන්න විමසා බැලිය යුතුයි. තවද තද හිරු එළිය, වර්ෂාව හා සුළඟ නිසා යම් හානිදායක තත්ත්වයක් වුවාද යන්න විමසීම ද කළ යුතුයි.



නිරෝගී වී බීජ



අව පැහැවීම හේතු ගණනාවක් නිසා හට ගනී

පළමු කොටම පළිබෝධ සතුන්ගේ හානියක් ද යන්න විමසා බලන්නේ කෙසේදැයි බලමු. මොවුන්ගේ හානියක් විනි නම් ඇතැම් විට බිත්තර හෝ ජීවන චක්‍රයේ වෙනත් ඕනෑම අවස්ථාවක් වගාව තුළ පැවතිය හැක. එය ඇතැම් විට පස තුළ හමුවන අවස්ථාවක් වුවද විය හැක. නැතිනම් මොවුන්ගේ හානිය සිදුකළ බවට ගොබයේ හානි වූ කොටස් මඟින් පෙනී යනු ඇත. නැතිනම් ඔවුන්ගේ අපද්‍රව්‍ය, ඉවත දමන ලද කොටස්, ශරීරයෙන් පිට කරන සිනිමය ශ්‍රාවයන් පැවතිය හැක. රෝගයකදී නම් පියවි ඇසට පෙනෙන ජීවීන් දැකිය නොහැකි අතර ශාකයේ විවිධ කොටස්වල අදාළ රෝග කාරකයන්ගේ හානියේ විශේෂිත වූ රෝග ලක්ෂණ දැකිය හැකි වේ. අහිතකර පාංශු තත්ත්වයන් නිසා ඇතිවන ගැටළුවකදී ඒ බව ක්ෂේත්‍රය දෙස විමසිලිමත්ව බැලීමේදී පවා නිරීක්ෂණය කළ හැකි වේ. ඇතැම් විටදී පර්යේෂණාගාරයක පාංශු පරීක්ෂාවක් අවශ්‍යවනු ඇත.

ක්ෂේත්‍ර ගැටළු එකම විටකදී ක්ෂේත්‍රයක කිහිපයක් පැවතිය හැකි අතර වැදගත්කම අනුව සලකා ඊට උචිත පරිදි පාලන ක්‍රම වේදයක් සැලසුම් කරගත යුතුය. එනම් ක්ෂේත්‍රයක සුළු පළිබෝධ හානියක් ලෙස කොළ හකුලන දළඹු හානිය පැවතිය හැකි අතර ප්‍රධාන හානිය වශයෙන් පවතින දුඹුරු පැල කිඩෑ හානියේ හෝ කොළ පාළු රෝගී තත්ත්වයන් පැවතිය හැකිය. එබැවින් මෙවැනි විටකදී කොළ හකුලන දළඹු හානියට වඩා අනෙක් ගැටළුව ගැන වඩා පරීක්ෂාකාරී වීම වඩා ප්‍රයෝජනවත් වනු ඇත.

වී වැනි භෝගයක ක්ෂේත්‍ර පරීක්ෂාවකදී නියර ඔස්සේ ගමන් කරමින් එය සිදු කිරීම ප්‍රමාණවත් නොවන අතර නියර අසල ලියද්දේ මුල්ලෙන් මුල්ලට ක්ෂේත්‍රය පුරාම ගොයම් පඳුරු ඈත් කරමින් පරීක්ෂා කළ යුතුයි. දුර්වලව වැඩෙන ශාකයක් පරීක්ෂා කිරීමේදී පොළොවෙන් ඉහළ කොටස පමණක් නොව පොළව තුළ පවතින මුල් පරීක්ෂා කළ යුතුයි.



...ලනේසි කුලයේ ගාඩ වටනු හානියට ලක් වූ මුල්



තද හිරු එළිය නිසා ඇති වූ හානි

ඇතැම් ක්ෂේත්‍ර ගැටළු ගොවි මහතාට සෘජුවම හඳුනාගත හැකිවනු ඇති අතර ඇතැම් කරුණු ගැන තීරණ ගැනීමට ඔහුට පෙර සඳහන් කළ තම වගාවේ වාර්තා හා ඇතැම් තාක්‍ෂණික කරුණු කාරණා සම්බන්ධව තමන් සතු තොරතුරු එකතුව පරිශීලනයෙන් තීරණය කළ හැකිවනු ඇත. එසේත් නොමැති නම් සුදුසු පුද්ගලයන් හෝ ආයතන වෙත යොමුවිය යුතුයි.

ගොවි මහතාගේ මට්ටමේදී හඳුනාගෙන තහවුරු කරගත් ගැටළුව නිරාකරණයට හැකි සෑම විටකදීම ශෂ්‍ය විද්‍යාත්මක, යාන්ත්‍රික ක්‍රමවේදයන් පිළිබඳව පළමුව සිතා බැලිය යුතුයි. අවසාන විසඳුම වශයෙන් පමණක් සීඝ්‍රව පැතිරී වන ක්ෂේත්‍ර ගැටළුවකදී පමණක් ඇතැම් විටකදී රසායන ද්‍රව්‍ය නිර්දේශිත පරිදි යෙදීම හොඳම විසඳුම විය හැක. උදහරණ ලෙස දක්වතොත් යල කන්නයේදී තද සූර්යාලෝකය නිසා ඩ්‍රැගන්ෆෘට් පඳුරුවල ඉහළ ශාඛා කහ පාට වී පිළිස්සී යාම වැලැක්වීමට ඉක්මණින් තාවකාලික පියවරක් ලෙස ආවරණ යෙදිය හැක. එමෙන්ම වගාව අතර සෙවන ශාක වැවීම වැනි දීර්ඝ කාලීන ක්‍රමවේදයන් ද ඊළඟට ක්‍රියාත්මක කළයුතු බව මතකයේ තබාගත යුතුය. සොලනේසියේ කුලයේ ශාකවල බැක්ටීරියා හිටුමැරීමේ තත්ත්වය පාලනය සඳහා ක්‍රමවත් ජල පාලනය ප්‍රයෝජනවත් වනු ඇත. වී වගාවේ බැක්ටීරියා කුණුවීම පාලනයට වගාවේ ජලය කපා හැරීම හොඳම විසඳුමයි.



අඹ වගාවේ පුහුණුව හා කප්පාදුව අනිවාර්ය අවශ්‍යතාවයකි

මේ අවස්ථාවේදී දීර්ඝ කාලීනව අදළ ගැටළුව පාලනය සඳහා ඊලඟ කන්නයේ සිට ගතයුතු පියවර අවබෝධ කරගෙන සිහි තබාගත යුතුයි. උදහරණයක් ලෙස ලවනතාවයකින් යුතු කුඹුරු සඳහා ලවණතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද භාවිතය හොඳම විසඳුම විය යුතුය. වී වගා කරන කුඹුරු ලියදි නිසි පරිදි සමතලා නොවීම නිසා ජල පාලනයේ ගැටළු ඇතිවන බවත් ඇතැම් තැනක ජලය රැඳීම නිසා වී පැළවීමේ ගැටළු ඇති වන බවත් ජලය නොලැබෙන උස් ගොඩැලි තැන්වල ගොයම් පැළ වැඩීම සිදු නොවී වල් පාලන ගැටළු ඇතිවන බවත් තේරුම් ගත යුතුයි.

ගොවි මහතාගේ මට්ටමේදී තීරණය කරගත නොහැකි වූ ගැටළු කඩිනම්ව සුදුසු අයෙකුගේ හෝ ආයතනය අවධානයට ලක් කරවා ගත යුතුයි. මෙහිදී ප්‍රදේශයේ මහවැලි සංවර්ධන අධිකාරිය හෝ ගොවිජන සේවා හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ සිටින ක්ෂේත්‍ර නිලධාරී මහත්වරු වෙත අදළ ගැටළුව යොමු කළ හැක. ඔවුන් විසින් නිවැරදිව ගැටළුව හඳුනාගෙන තීරණ ලබාදීම හෝ අදළ වෙනත් ආයතනයක් වෙත යොමු කිරීම ඉන්පසු සිදුවිය යුතුය. ගොවි මහතුන් කෘෂිකාර්මික හා යාන්ත්‍රික ක්‍රමයන් නොසලකා කටයුතු කරන අතර එකම විසඳුම ලෙස රසායනික ක්‍රමයන් භාවිතා කරමින් ගැටළුව නිසි ලෙස හඳුනා නොගෙන දිලීර ගැටළුවක් සඳහා කෘමි නාශක ද

කෘෂි හානියකට හෝ පෝෂක ඌනතාවයකට දිලීර නාශක ද භාවිතා කරනු පෙනේ. තවද, වගාවට ඉසින්න "සැරම තෙලක්" සොයා යමින් සුදුසුකම් නොලත් කෘෂි රසායන වෙළඳසැල් වෙතින් ද උපදෙස් පතන අවස්ථා කොතෙකුත් දැකිය හැක. එයින් වන්නේ මුදලත්, වගාවත්, පරිසරයත් විනාශවීම පමණි.

පරීක්ෂා කිරීම සඳහා සාම්පල ඉදිරිපත් කිරීමේදී ගොවි මහතුන් පමණක් නොව බොහෝ ක්ෂේත්‍ර නිලධාරීන් අතින් සිදුවන වැරදි නිසා නිවැරදි තීරණවලට එළඹීම පමා වේ. අදාළ ක්‍රමවේදය පිළිබඳව මෙහිලා සඳහන් කිරීම වටියි.

i. පළමුව ක්ෂේත්‍රයේ පවතින වඩා වැදගත්ම හා ඉතා ඉක්මනින් විසඳුම සොයාගත යුතු වන ගැටළුවට අදාළ සාම්පල රැස් කිරීමට පියවර ගතයුතුය.

ii. අදාල සාම්පල ලබා ගැනීමේදී ක්ෂේත්‍රයේ විවිධ තැන්වලින් ලබාගත් අදාළ ගැටළුව නියෝජනය වන ශාක හෝ කොටස්වල එකතුවක් හෝ පිවින් හෝ ඔවුන්ගේ පිවින් එකතුවක් විය යුතුයි. පිවින්ගේ සාම්පල එක්රැස් කිරීමේදී ඇතැම් පිවින් කුඩා සිදුරු සහිත බඳුන් තුළ එකතුකොට හෝ ශාක කොටස් සමඟ බෑග්වල අසුරා හෝ ඉදිරිපත් කළ හැකිය.

iii. ගැටළුව පාංශු ගැටළුවක් යැයි සිතෙන අවස්ථාවලදී ශාක අවටින් ලබාගත් පස් සාම්පල ලේබල් කර මතු ප්‍රයෝජන සඳහා අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට රැස්කරගත යුතුයි.

iv. ගැටළුවේ ස්වභාවය අනුව එකතු කර ගනු ලබන ශාක හෝ ශාක කොටස් වෙනස් විය හැකිය.

ගොයම් ශාකවල ගැටළුවක් නම් බොහෝ විට පසුත් සමග ලබාගත් ගොයම් සම්පූර්ණ ශාක කිහිපයක් ප්‍රයෝජනවත් විය හැකිය. වී, බඩඉරිඟු වැනි එක් බීජ පත්‍රී ශාකවල පත්‍ර කොටස් පමණක් ආවරණය නොකර සාම්පල රැස්කර ගැනීම ප්‍රතිඵලදායී නොවන්නේ ඒවා ඉතා කෙටි කිරීම වියලී රෝල් වී යන නිසයි.

වෙනත් ශාක කොටස් ලබා ගැනීමේදී ද, භෝගයන් සඳහා ශාකයේ විවිධ කොටස් සාම්පල වශයෙන් එක්රැස් කර ගැනීම ඇතැම් විටකදී අවශ්‍ය වනු ඇත. කෙසෙල් ශාක මැලවීමේදී/මිය යාමේදී නම්, ව්‍යාජ කඳේ කොටස්, භූගත සත්‍ය කඳේ කොටස් හා මුල් සාම්පල ද වැදගත් වනු ඇත.

ඇත්ත වශයෙන්ම මේ සෑම ශාක කොටසක්ම නිසි පරිදි පොලිතින් වලින් ආවරණය කොට ඉන්පසු සූර්යාලෝකයෙන් වියලීම වැළැක්වීමට අඳුරු ආවරණයක අසුරා ප්‍රවාහනය කළ යුතුයි. සෑම සාම්පලයකින්ම ලේබල් කොට අදාළ තොරතුරු සමග ඉදිරිපත් කළ යුතුයි. එමෙන්ම ශාක කොටස් ලබා ගැනීමට භාවිතා කළ උපකරණ පවිත්‍ර කොට භාවිතයට ගැනීම අත්‍යාවශ්‍යය. එනම් පේර වගාවේ වටපනු හානිය, කෙසෙල් වගාවේ පැනමා රෝගය වැනි අවස්ථාවල සාම්පලයන් අතරමගදී තැන තැන දමා යාම නොකළ යුතු තත්ත්වයන්ය.

රෝගයක් වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කිරීමේදී රෝගියා හෝ භාරකරු අදාළ ආශ්‍රිත තොරතුරු හෙළිදරව් කරන ලෙසටම සාම්පලය සමඟ අනිවාර්යෙන්ම ලිඛිතව ඒකරාශි කරගත් ඒ හා ආශ්‍රිත තොරතුරු සමුදායක් පැවතීම පරීක්ෂකයාගේ කාර්යය සාර්ථක කර ගැනීමට හේතු වේ. නිසි පරිදි තොරතුරු ඒකරාශි කර නොගත් වැරදි සාම්පලයකින් නිවැරදිම නිර්දේශය බලාපොරොත්තු වීම සාම්පලය රැගෙන එන්නාට අයිතියක් නොමැත. සාම්පලයත් සමග ඉදිරිපත් විය යුතු තොරතුරු පහත පරිදි විය හැකිය.

- භෝගය පිළිබඳ තොරතුරු - ප්‍රභේදය, දිනය, වයස ආදිය, මුළු වගා වපසරියෙන් හානි වූ ප්‍රදේශය, සාම්පලය ලබා ගත් ප්‍රදේශය (ගොවිපල) හෝ ග්‍රාමය
- දැනුම් දෙන්නා පිළිබඳ තොරතුරු - නම, ලිපිනය, දුරකථන අංකය
- ඒරෝෂිත ලක්ෂණ/රෝග ලක්ෂණ ආදිය

- සි දු කරන ලද කෘෂිකාර්මික කටයුතු - ජල සම්පාදනය, පොහොර යෙදීම, වල් පාලනය වැනි
- කා ලගුණ තත්ත්වයන් - සාම්පලය ලබා ගැනීමේදී හා ආසන්න සති 2 ක කාල සීමාවක් හෝගයේ ඉතිහාසය - පෙර වගාවන්හිදී තත්ත්වය ආදිය
- පස - ප සේ ලවනතාවය, pH අග ය, පාංශු ගැඹුර, ලවන එක්රැස්වීම
- සි දු කරන ලද ප්‍රතිකාර ක්‍රම හා ඒවායේ ප්‍රතිඵල

මෙලෙස අදාල තොරතුරු සහිතව පරීක්‍ෂා කරන්නාට හෝ ආයතනයට යොමු කරන්නේ නම් එමගින් ඉතා ඉක්මණින් හා නිවැරදි ප්‍රතිඵල ලබා ගැනීමට ගොවි මහතාට හෝ ක්ෂේත්‍ර නිලධාරියාට හැකි වේ.

# කටු අල

පැරණි ලංකාවේ ගම්වල හා ස්වාභාවික වනාන්තර ආශ්‍රිතව වැවුණු වැල් අල විශේෂයක් කටු අල නමින් හැඳින්වෙයි. වනගතව ජිවත් වූ වැද්දන් දිග උල් හා ශක්තිමත් රිටි යොදගෙන ක වූ අල හාරා ගැනීම බහුලව සිදුවිය. අද වනවිට ඉතා දුර්ලභ වැල් අල විශේෂයකි. කටු අල වල ලක්‍ෂණ කිහිපයකි. වැල අඩි කිහිපයක් දිගට විහිදෙයි. වැල පුරා කුඩා කටු ඇත. පත්‍ර කුඩාය. මල් පිපෙන කාලයට කුඩා සුදු මල් පිපෙයි.

දෙනි - තැනිතලා දියලු බිම්වල ඉතා සරුවට වැඩෙයි. වියළි වනාන්තර වල ඉබේ වැවුණි. අවුරුදු කිහිපයක් හාරා නොගත් විට විශාල අල බසියි. කටු අල බිඳීම ඉතා දුෂ්කරය. අඩි පහක් හයක් ගැඹුරට වෙහෙසකර ලෙස සෑරිය යුතුය. සමහර විට දිනක් දෙකක් ඒ සඳහා වෙහෙසවිය යුතුය. අල පටුය, දිගටිය, ඉතා රසවත්ය. තම්බාගත් විට රසවත් පෝෂ්‍යදායක ආහාරයකි. අඩි තුන හතරක් දිගට පටු දිගටි අලය යටට විහිදෙයි.

එය මිනිසුන්ගේ මෙන්ම වනගත සතුන් ද හාරන සතුන්ගේ ද ආහාරයකි. වැද්දන්ගේ ආහාරයේ ප්‍රධාන අංගයක් වූයේ කටු අලයි. කුරක්කන් කපන කාලයට කටු අල ගැලවීම පැරණි චාරිත්‍රය විය.

(දඹුල්ල, වැලමිටියාව ශ්‍රී සුමංගල ගොවි සංවිධානයේ සභාපති දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික ගලේවල කුඩා වැව සිල්වත්ගම පදිංචි සාම විනිසුරු ඒ.පී. පුංචි බණ්ඩා මහතා සමඟ කළ සාකච්ඡාවකින් මේ තොරතුරු ලබා ගතිමි).

එස් කේ.ජයවර්ධන
[illegible]
ගොම්කැනුම්, කාපාන - ගුත්තැපාන